සියලුම හිමිකම් ඇවිරිණි
All Righis Reserved

# කැලණිය අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණ 2016

## 8 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය I

නම/විෂය අංකය ---------------------------------------- කාලය පැය 2

### I කොටස

ලකුණු 40

01. අප සිතාමතා කරන ක්‍රියා කර්මය ලෙස හැඳින්වේ. එම කර්මය කොටස් කිහිපයකට බෙදේ එම ගණන වන්නේ
    (1) තුනකි (2) දෙකකි
    (3) හතරකි (4) පහකි

02. 'හිරි ඔත්තප්ප'' යනු ලෝක පාලන ධර්මයි. මෙහි ඔත්තප්ප යනු ,
    (1) පවිකිරීමට ඇති භයයි (2) පවිකිරීමට ඇති ලජ්ජාවයි
    (3) පවිකිරීමට ඇති පසු ගාමී බවයි. (4) පවිකිරීමට ඇති කැමැත්තයි

03. දුක්ඛාර්ය සත්‍යයෙහි ඇතුළත් දුකකි. ඉච්ඡිත අලාභ දුක්ඛය. එයින් අදහස්වන්නේ,
    (1) කැමැති දේ නොලැබීමේ දුකයි
    (2) කැමැති දේ අත්හැරීමේ දුකයි.
    (3) කැමැති දේ නොවිඳි වේ දුකයි
    (4) කැමැති දේ පැහැර ගැනීමේ දුකයි

04. දුකට හේතුව තණ්හාව යනුවෙන් චතුරාර්ය සත්‍යයේදී දේශනාකර ඇත. එම අදහස ඇතුළත් අර්ය සත්‍ය වන්නේ,
    (1) දුක්ඛා ආර්ය සත්‍යයි
    (2) දුක්ඛ සමුධය ආර්ය සත්‍යයයි.
    (3) දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යයයි
    (4) දුක්ඛ නිරෝධ ගාමිණි පටිපදා ආර්ය සත්‍යයයි.

05. බුදුරජාණන්වහන්සේට කිඹුල්වත් පුරට වැඩමකරන ලෙස ඉල්ලා සුද්ධෝන රජතුමාගේ පණිවිඩය රැගෙන ගිය ඇමැතිවරයා වන්නේ ''
    (1) සකුළු දායිය (2) කාළුදායිය
    (3) ජන්න ය (4) වස්සකාරය

06. බුදු රජාණන්වහන්සේ කිඹුල්වත් පුර ගමනේදී විවිධ පුද්ගලයින් මුල්කරගෙන ධර්මය දේශනා කළසේක. එම . දේශනාකළ ගාථාවකි. ''උත්තිට්ඨෙ නප්පමජ්ජෙය්‍ය ධම්මං සුචරිතංචරේ... '' මෙම ගාථාව දේශනා කරමින් ධර්මය දේශනා කළේ

(1) ශාක්‍යයන්ටයි (2) සුද්ධොධන රජතුමාටය.

(3) යසෝධරා දේවියටයි. (4) නන්ද කුමරුටය.

07. සුද්ධෝදන මහරජතුමා යශෝධරා දේවියගේ ගුණ වර්ණනා කරමින් ඇය ගෙවූ දුක්බර ජීවිතය ගැන බුදුරදුන්ට පැහැදිලි කළේය. එම ප්‍රකාශය මුල්කරගෙන දේශනාකළ ජාතකය වන්නේ ''

(1) වෙස්සන්තර ජාතකය (2) සම්බුලා ජාතකයයි

(3) සඳකිඳුරු ජාතකය (4) අපණ්ණක ජාතකය

08. ''බුදු රජාණන්වහන්සේ ඔබ ළඟට එනවා මිස ඔබ උන්වහන්සේ ළඟට යන්න අවශ්‍ය නැහැයි.'' තව ශ්‍රාවකයන් පැවසුවේ

(1) සකුළුදායි පිරිවැජියාටය. (2) උපාලි ගෘහපතියාටය

(3) පොක්ඛරසාති බ්‍රාහ්මණයාටය (4) භාර්ගව බමුණාටය.

09. දුරසිට වුවද ගෙනවිත් පිරිනැමූ සිව්පසය පිළිගැනීමට සුදුසුවන බැවින් මහ සගරුවන

(1) පාහුණෙය්‍ය ගුණයෙන් යුක්තයි.

(2) ආහුණෙය්‍ය ගුණයෙන් යුක්තයි

(3) දක්ඛිණෙය්‍ය ගුණයෙන් යුක්තයි

(4) අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ගුණයෙන් යුකතයි.

10. ''අසාරේ සාර මතිනෝ සාරේ චාසාර දස්සිනෝ'' සඳහන් ගාථාපාඨයේ සරල අදහස වන්නේ

(1) සරු දෙය සරු දෙය හැටියටත් නිසරු දෙය නිසරු ලෙසත් ගැනීමත්

(2) නිසරු දෙය සරු ලෙසත් සරු දෙය නිසරු ලෙසත් ගැනීමය

(3) සරු දේත් නිසරු දේත්, නිසරු ලෙස ගැනීමයි

(4) සරු දේත් නිසරු දේත් සරු ලෙස ගැනීමත්ය

11. චතුරාර්යසත්‍ය ධර්ම දේශනාවේ දී පරිදේව යන්න දේශනා කර ඇත. මෙය ඇතුළත් වන්නේ ,

(1) දුක්ඛ ආර්ය සත්‍යයටයි.

(2) දුක්ඛ සමුධයාර්ය සත්‍යයටයි.

(3) දුක්ක නිරෝධාර්ය සත්‍යයටයි

(4) දුක්ඛ නිරෝධගාමිණි පටිපදා ආර්ය සත්‍යයටයි'

12. බුද්ධානුස්සති භාවනාව වැඩීමේදී අප ප්‍රකාශ කළ පාඨයක් පහත දැක්වේ. ''මගේ බුදු රජාණන් වහන්සේ උතුම් ඤාණ අටකින්ද චරණ ධර්ම 15 කින් ද සමන්විත වන සේක. '' එම පාඨයෙන් අර්ථවත් වන්නේ බුදුරජාණන්වහන්සේගේ

(1) අරහං බුදුගුණයයි (2) සම්මා සම්බුද්ධ බුදු ගුණයයි

(3) විජ්ජාචරණ සම්පන්න බුදු ගුණයයි (4) ලෝක විදූ බුදු ගුණයයි.

13. ''භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේට ලැබෙන වටිනා සිවුරු මට නොදෙන සේක්වා. ඔබ වහන්සේට ලැබෙන පිණ්ඩපාතය මට නොදෙන සේක්වා. ඔබ වහන්සේ සමග එක ගඳ කිළියෙහි විසීමට ඉඩ නොදෙන සේක්වා --------'' යනුවෙන් බුදු රජාණන්වහන්සේගෙන් අවසර ඉල්ලා සිටින ලද්දේ,

(1) නාගසමාලා තෙරුන්වහන්සේ විසිනි (2) නාගිත තෙරුන් වහන්සේ විසිනි
(3) මේඝිය තෙරුන්වහන්සේ විසිනි (4) ආනන්ද තේරුන්වහන්සේ විසිනි.

14. ගෘහ ජීවිතය ගත කරන සියලු දෙනාටම අදාල වන්නාවූ ශීලය

(1) උපෝසථ ශීලය යි. (2) ආජීවක අෂ්ටමක ශීලය යි.
(3) දස ශීලය යි. (4) ගේහසික ශීලය යි.

15. තම රහස් මිතුරාට කියයි. මිතුරාගේ රහස් රැක ගනී. විපතේදී අත් නොහරියි. දිවි පරදුවට තබා මිතුරාගේ කටයුතු කරයි. යන ලක්‍ෂණ දක්නට ඇත්තේ.

(1) උපකාරක මිතුරා කුළය (2) සමාන සුඛදුක්ඛ මිතුරා තුළය
(3) අත්ථක්ඛායි මිතුරා තුළය (4) අනුකම්පක මිතුරා තුළය

16. තමාටත් වඩා ආදරය කරන වෙනත් කිසිවෙක් ඔබට ඇද්දැයි තම දේවියගෙන් අසන ලද්දේ

(1) බිම්බිසාර රජතුමා විසින (2) අජාසත් රජතුමා විසිනි
(3) කොසොල් රජතුමා විසිනි (4) උදේනි රජතුමා විසිනි.

17. ''අසාරේ සාරමතිනෝ සාරේ චාසාර දස්සිනෝ-----'' යන ගාථාව බුදු රදුන් දේශනා කරන ලද්දේ,

(1) උපතිස්ස පිරිවැජියාටය (2) සංජය පිරිවැජියාටය
(3) කෝලිත පිරිවැජියාටය (4) සකුළුදායි පිරිවැජියාටය

18. ආනන්ද හිමියන්ට තනතුරු ලැබුණේ විවිධ කුසලතා පදනම් කරගෙනය. උන්වහන්සේ ලත් තනතුරක් නොවන්නේ ,

(1) බහුශ්‍රැතයන් අතරින් අග්‍රවීම
(2) සිහිකල්පනා අත්තවුන් අතරින් අග්‍රවීම
(3) ධෛර්ය සම්පන්න වූවන් අතරින් අග්‍රවීම
(4) ප්‍රඥාවන්තයින් අතරින් අග්‍රවීම

19. 'යෝ වදතං පවරෝ මනුජේසු ' යන ගාථාව දේශනා කළේ

(1) රාධ බ්‍රාහ්මණයාටය (2) ඡත්ථ මානවාකයාට ය
(3) රාහුල හිමියන්ටය (4) ඡන්න හිමියන්ටය.

20. මළගෙදරක පවත්නා පාළුව , ශෝකය, දුරුකර ගැනීම සඳහා පැවැති පැරණි චාරිත්‍රයක් වූයේ

(1) පිරිත් දේශනා කිරීමයි (2) වෙස්සන්තර ජාතකය කියවීමයි
(3) ධර්ම දේශනා පැවැත්වීමයි (4) කවිබණ කීමයි.

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළු තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.

01. බුද්ධ ධර්ම විෂයට අදාළව දෙවන වාරයේ පරිසර හිතකාමීවීමේ වැදගත්කම පැහැදිලි වන අයුරින් සකස්කර බිත්ති පුවත්පත ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. අප පරිසරයේ දක්නට ඇති ස්වභාවික සම්පත් දෙකක් ලියන්න. (ල.2)

ii. අප අවට පරිසරය විනාශවන මිනිස් ක්‍රියාකාරකම් දෙකක් ලියන්න. (ල.2)

iii. පරිසරයෙන් අපට ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න. (ල.2)

iv. පරිසරය විනාශය නිසා අපට සිදුවන හානි දෙකක් ලියන්න. (ල.2)

v. පරිසරය ආරක්ෂාකිරීමට බුදුදහමින් ලබාදෙන උපදෙස් දෙකක් ලියන්න. (ල.2)

vi. බිත්ති පුවත්පත සකස් කිරීමට තොරතුරු ලබාගත් ආකාර දෙකක් ලියන්න. (ල.2)

vii. බිත්ති පුවත්පත සකස් කිරීමේදී ඔබ ලත් අත්දැකීම් දෙකක් ලියන්න. (ල.2)

viii. කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමේදී මුහුණ දුන් ගැටළු දෙකක් ලියන්න. (ල.2)

ix. පරිසරය සංරක්ෂණය කිරීමේ වැදගත්කම ප්‍රකට කෙරෙන ආදර්ශ පාඨ දෙකක් ලියන්න. (ල.2)

x. පංතිකාමරය අලංකාර කිරීමට ඔබ ඉදිරිපත් කරන යෝජනා දෙකක් ලියන්න. (ල.2)

02. i. "කුසල" යන්නට යෙදිය හැකි වෙනත් වචනයක් ලියන්න. (ල.2)

ii. දස කුසල් වල ඇති කරුණු තුනක් ලියන්න. (ල.3)

iii. කුසල කර්ම තුළින් කිරීම සමාජය යහපත්වන අයුරු විස්තර කරන්න. (ල.5)

03. i. චතුරාර්ය සත්‍යයේ මුල් ආර්ය සත්‍ය දෙක නම් කරන්න. (ල.2)

ii. ඉන් එකක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ල.3)

iii. දුක හමුවේ උදාසීන නොවී ධෛර්යයෙන් දුකට මුහුණ දිය යුතු ආකාරය පැහැදිලි කරන්න. (ල.5)

04. i. "අචරිත්වා බ්‍රහ්මචාරියං------" යන ගාථාව ලියන්න. (ල.2)

ii. එහි සරල අර්ථය ලියන්න. (ල.3)

iii. නිසි කාලයේදී ඉගෙන ගැනීමේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න. (ල.5)

05. i. "සේඛියා" යන වචනයේ අර්ථය ලියන්න. (ල.2)

ii. බෞද්ධ භික්ෂූන් වහන්සේ නමක් දන් වැළඳීමේදී අනුගමනය නොකරණ කරුණු තුනක් ලියන්න. (ල.3)

iii. සේඛියා අනුගමනය කිරීම පුද්ගල සංවර්ධනයට හේතුවන ආකාරය පැහැදිලි කරන්න. (ල.5)

06. i. සිගාලෝවාද සූත්‍රයේ සඳහන් මිත්‍ර ප්‍රතිරූපකයන් දෙදෙනෙකු නම් කරන්න. (ල.2)

ii. ඉන් එක් අයෙකුගේ ස්වභාවය පැහැදිලි කරන්න. (ල.3)

iii. ඔබ කළණ මිතුරෙකු ආශ්‍රයෙන් ලබන ප්‍රයෝජන පහක් ලියන්න. (ල.5)

07. i. "අත්තූපනායික ධර්ම පර්යාය" යන්නෙහි අර්ථය ලියන්න. (ල.2)

ii. ලෝකයෙහි දක්නට ඇති සතර ආකාර පුද්ගලයන් දෙදෙනෙකු නම් කරන්න. (ල.3)

iii. පස්පයින් වැළකීම සමාජ දියුණුවට හේතුවන ආකාරය පහදන්න. (ල.5)